*සැ. යු.*– 2006.12.15 වැනි දින පළවූ අංක 1,476 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,477 - 2006 දෙසැම්බර් 22 වැනි සිකුරාදා - 2006.12.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 1626 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1628 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1626 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1628 |
| තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 දෙසැම්බර් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 දෙසැම්බර් මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයට පෙට්‍රල් ටැන්ක් වැගන් සඳහා බෝගී 12ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය (12 Nos. Bogies for Petrol Tank Wagons)

ශ්‍රී ලංකා දුම්රිය සේවයට පෙට්‍රල් ටැන්ක් වැගන් සඳහා බෝගී 12ක් (12 Nos. Bogies for Petrol Tank Wagons) සැපයීම සඳහා කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 01, දුම්රිය හා ගමනාගමන අමාත්‍යාංශයේ, අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, නිෂ්පාදකයින්ගෙන් හා/හෝ සැපයුම්කරුවන්ගෙන් බාරගනු ලබයි. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිළ ගණන් ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද ශ්‍රී ලංකාව තුල ලියාපදිංචි නියෝජිතයෙකු මාර්ගයෙන්ද ඉදිරිපත් කළ හැක.

2. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙත හෝ පිටරටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත 2006.12.01 සිට 2006.12.21 දක්වා පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ආපසු නොගෙවනු ලබන රු. 10,000 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් හෝ ඒ සමාන විදේශ මුදල් ප්‍රමාණයක් ගෙවා ලබාගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය 2007.01.12 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) වේ. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය.

සභාපති,
අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව,
ලේකම්, දුම්රිය හා ගමනාගමන අමාත්‍යාංශය බාරේ,
අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

ලියාපදිංචි තැපෑලේදී සිදුවන තැපැල් ප්‍රමාදයන් සඳහා දුම්රිය හා ගමනාගමන අමාත්‍යාංශය හෝ දුම්රිය දෙපාර්තමේන්තුව වගකීම භාරගනු නොලැබේ.

4. *ටෙන්ඩර්පත් විවෘත කිරීම.–* ටෙන්ඩර්පත් භාරගැනීම අවසන්වූ විගස ඉහත ඡේද අංක 3 හි සඳහන් ලිපිනයේදී සිදුකෙරේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාව ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට සහභාගී වීමට අවසර දෙනු ලැබේ.

5. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර්පත් අය කිරීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

6. *වැඩි විස්තර සඳහා.–* දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව. දුරකථන අංක : 94(11)2432044 හෝ 94(11)2436818 අමතන්න. ෆැක්ස් : 94(11)2432044 ඊ-මේල් : sls@sierra.lk
(යොමුව : SRS/F. 6457)

සභාපති,
අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව.

12-688

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා /මහේස්ත්‍රාත් අධිකරණය - පූගොඩ

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද භාණ්ඩ වලින් හිමිකම් නොපාන ලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පූගොඩ දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාල වූ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2006.12.27 වෙනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන යම් අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර තම හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසියට සූදානම් කර ඇති භාණ්ඩ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් ලබා ගන්නා ලද භාණ්ඩ සඳහා එවෙලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, ගෙවීම් සියල්ලම මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ලබා ගැනීමට අදහස් කරන සෑම අයෙකුම තමන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණිය යුතුය.

ඩබ්ලිව්. සී පුෂ්පමාලි,
දිසා විනිසුරු පූගොඩ.

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පූගොඩ.

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩය* |
|---|---|---|
| 01 | 87002 | අංක 2166 දරන ඇග්‍රෝ වර්ගයේ වතුර මෝටර් 01 යි |
| 02 | ඒ/836/05 | අංකය ඇපැහැදිලි වතුර මෝටර් 01 යි |
| 03 | 72934 | අංක 12623 දරන ඇග්‍රෝ වර්ගයේ වතුර මෝටර් 01 යි |
| 04. | 51204 | (i) අංක ඩබ්. 10242 දරන රොබින් වර්ගයේ කහපාට වතුර මෝටර් 01 යි |
| | | (ii) කොළපාට හෝස් 01 යි |
| | | (iii) කුඩා වේවැල් කුඩ 02 යි |
| 05. | 54293 | බටපතුරු වලින් සකස් කරන ලද ගැරුම් වට්ටි 01 යි |
| 06. | 53953 | බටපතුරු වලින් සකස් කරන ලද කුඩ 01 යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 07. | 53039 | බට පතුරු වලින් සකස් කරන ලද කූඩ 01 යි |
| 08. | 56830 | බට පතුරු වලින් සකස් කරන ලද කූඩ 02 යි |
| 09. | 94038 | (i) නි. වි. ම. පෙරීමට ගන්නා ලද ඇලුමිනියම් මුට්ටි 01 යි |
| | | (ii) නි. වි. ම. පෙරීමට ගන්නා ලද ඇලුමිනියම් කල 01 යි |
| 10. | 62116 | කුඩා කැසට් 02 ක් හා බfපල් 01 යි |
| 11. | 52108 | අංක 253-9409 කැබ් රථයේ ඉදිරි ආවරණ වැට |
| 12. | 52619 | අංක 57-8327 වෑන් රථයේ ඉදිරි ආවරණ වැට |
| 13. | 51635 | අංක 250-7926 දරන කැබ් රථයේ ඉදිරි ආවරණ වැට |
| 14 | 57602 | (i) සවල් 01 යි |
| | | (ii) බාල්දි 01 යි |
| 15 | 57531 | (i) සවල් 01 යි |
| | | (ii) බාල්දි 01 යි |
| 16 | 57588 | මිට සහිත සවල් 01 යි |
| 17 | 56970 | බාල්දි 01 යි |
| 18 | 56969 | බාල්දි 01 යි |
| 19 | 55365 | (i) සවල් 01 යි |
| 20 | 50624 | මිට සහිත සවල් 01 යි |
| 21 | 54802 | මිට සහිත සවල් 01 යි |
| 22 | 54434 | මිට සහිත සවල් 02 යි |
| 23 | 54433 | මිට සහිත සවල් 02 යි |
| 24 | 54803 | මිට සහිත සවල් 01 යි |
| 25 | 54436 | මිට සහිත සවල් 02 යි |
| 26 | 50627 | මිට සහිත සවල් 01 යි |
| 27 | 54804 | මිට සහිත සවල් 01 යි |
| 28 | 75218 | ගෑස් සිලින්ඩර් 01 යි |
| 29 | 87886 | ගෑස් සිලින්ඩර් 01 යි |
| 30 | 83206 | ගෑස් සිලින්ඩර් 01 යි |
| 31 | 94721 | ගෑස් සිලින්ඩර් 01 යි |
| 32 | 80075 | ගෑස් සිලින්ඩර් 01 යි |
| 33 | 96259 | ආමර් වර්ගයේ බූමිතෙල් ගෑස් ලිප් 01 යි |
| 34 | 55246 | වීත්ත යාර 01 යි |
| 35 | 55247 | වොට් 15 බලබ් 01 යි |
| 36 | 54292 | යකඩ ඉනි 01 යි |
| 37 | ඒ/109/02 | වාහන වලට සවි කරනු ලබන කැසට් යන්ත්‍ර 01 යි |
| 38 | 5196/බී | බූමිතෙල් ලිප් 01 යි |
| 39 | 74682 | සෙලියුලර් දුරකථන 01 යි |
| 40 | 54775 | කොළපාට සන්ටෝ වර්ගයේ කොම්ප්‍රෙෂර් 01යි |
| 41 | 54291 | අංක එන්. 25 එල්3 දරන රතුපාට මෙට්ෂුබිෂි වර්ගයේ කොම්ප්‍රෙෂර් 01 යි |
| 42 | ඒ.110/06 | i. වයි 18 රොබින් වර්ගයේ එන්ජින් එකයි |
| | | ii. වායු ගබඩා කරන සිලින්ඩර් 01යි |
| | | iii. යාර 30 ක් දිග දුඹුරුපාට නයිලෝන් කඹ 01 යි |
| | | iv. බට කූඩ 02 යි |
| 43 | 55365 | බාල්දි 01 යි |
| 44 | 55609 | බාල්දි 01 යි |
| 45 | 56834 | බාල්දි 01 යි |
| 46. | 56832 | බාල්දි 01 යි |
| 47 | 56831 | බාල්දි 01 යි |
| 48 | බී/7196 | (i) පැනසොනික් වර්ගයේ කැසට් රේඩියෝව |
| | | (ii) හීරෝ වර්ගයේ බිත්ති ඔරලෝසුව |
| 49. | බී/7510 | (i) නැෂනල් වර්ගයේ කැසට් රේඩියෝව |
| | | (ii) සෝනි වර්ගයේ කැඩී ගිය රේඩියෝව |
| 50 | 65263 | රේඩියෝවක කොටස් කීපයක් |
| 51 | 6980/බී | (i) වාහන කැසට් රේඩියෝව |
| | | (ii) කුඩා ස්පීකර් 03 යි |
| 52 | 96264 | නිල්පාට ප්ලාස්ටික් බැරල් 05 යි |
| 53 | 93491 | බූමිතෙල් සිලින්ඩරය හා ලිප |
| 54 | 80075 | ගෑස් ලිප් 01 යි |
| 55 | | ගෑස් ලිප් 01 යි |
| 56 | | ගෑස් ලිප් 01 යි |
| 57 | | ගෑස් ලිප් 01 යි |
| 58 | | ගෑස් ලිප් 01 යි |
| 59 | | ගෑස් ලිප් 01 යි |
| 60 | 48281 | අංක 77-8920 දරන අත් ට්‍රැක්ටරය |
| 61 | 69049 | අංක 90 ශ්‍රී 6956 හොන්ඩා යතුරු පැදිය |
| 62 | බී. 449/05 | අංක 118-8772 දරන යතුරුපැදිය |
| 63 | 52234 | 80 ශ්‍රී 7065 දරන යතුරු පැදිය |
| 64. | 74795 | 85 ශ්‍රී 3740 දරන යතුරු පැදිය |
| 65 | 58122 | අංක ජීඑස්. 25699 දරන ස්පෝට්ස් වර්ගයේ පාපැදි 01 යි |
| 66 | 69652 | ඒ. 1267786 දරන ලුමාලා වර්ගයේ පාපැදි 01 යි |
| 67 | බී. 7820 (70260) | අංක ඩී. ඒ. 013 දරන කලුපාට ප්ලයිං පිජන් වර්ගයේ පාපැදි 01 යි |
| 68 | ඒ.1302/05 | අංකය හා වර්ගය නොමැති ලා නිල් තීන්ත ආලේපිත පාපැදි 10 යි |
| 69. | ඒ. 1302/05 | අංක වයි 181702 දරන හීරෝ වර්ගයේ රතුපාට පා පැදි 10 යි |
| 70 | ඒ/87/06 | අංකය හා වර්ගය අපැහැදිලි පා පැදි 01 යි |
| 71. | ඒ/1291/05 | සීබ්‍රා වර්ගයේ අංක ඒ 31222 දරන පාපැදිය |
| 72. | 81192 | වර්ගය අපැහැදිලි අංක 66118041 දරන පාපැදිය |
| 73 | ඒ/1288/05 | අංක අපැහැදිලි පාපැදිය (ඉදිරි රෝදය ගැලවී ඇත) |
| 74 | ඒ/1289/05 | අංකය හා වර්ගය අපැහැදිලි කොළපාට පාපැදිය (කැලි ගැලවී ඇත) |
| 75 | ඒ/1290/05 | අංකය සී 1948 දරන නිල් පැහැති හීරෝ වර්ගයේ පාපැදි 01 යි |
| 76 | | හීරෝ රෝයල් වර්ගයේ පාපැදි 01 යි |
| 77 | | 559511631 රොබින්සන් වර්ගයේ අබලන් පාපැදි 01 යි |
| 78 | 1209 | සිංගර් වර්ගයේ බීජී. 17979 දරන පිටුපස රෝදය පිලිස්සුනු අබලන් පා පැදිය |
| 79 | 62742 | රබර් ෂීට් තොගයක් |
| 80 | | තලන ලද තඹ දහර තොගයක් |
| 81 | | හිස් වීදුරු බෝතල් තොගයක් |
| 82 | | පොඩි කෑන් තොගයක් |
| 83 | | හිස් බූලි කීපයක් |
| 84 | | හිස් බැරල් කීපයක් |

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ගලෙන්බිඳුනුවැව, 21 ජනපදය බටහිර, අංක 105 දරන ලිපිනයෙහි පදිංචි ටිකිරි බංඩාගේ විමලාවතී වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියදර්ශණී අත්තනායක මහත්මිය විසින් ලියා සහතික කළ වර්ෂ 2005.11.30 වැනි දිනැති අංක 66 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කහටගස්දිගිලිය, කැබැතිගොල්ලෑව පාර පදිංචි ධනපාලගේ මහේන්ද්‍ර අරම්පල වෙත දෙන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරනු ලබන බවද මින් පසුව මෙම ඇටෝර්නි බලපත්‍රය කිසිදු බලපෑමක් නොමැති බවද සියල්ලෝම මෙයින් දැන ගනිත්වා.

ටිකිරි බංඩාගේ විමලාවතී.

12-731

## සියළු දෙනාගේම දැන ගැනීම පිණිසයි

මැද මහනුවර, දුනුවිල, හඟුරුගමවත්ත, “සඳසිරි ” හි පදිංචි රාජපක්ෂ අධිකාරි ආරච්චිගේ ගාමිණී ඩයනේෂියස් වීරසේකර වන මා විදේශ ගතව සිටින කාලය තුළ දී මා වෙනුවෙන් සහ මාගේ නාමයෙන් ක්‍රියා කිරීම සඳහා මාගේ ඇටෝර්නි බලකරු ලෙස මැද මහනුවර, දුනුවිල, හඟුරුගමවත්ත, “සඳසිරි” හි පදිංචි බෙනඩික් ජෝශප් ස්ටාලින් ප්‍රනාන්දු (ජා. හැ. ප. අංක 650400429 V) යන අයට ප්‍රසිද්ධ නොතාරිස් ගයත්‍රී ගීතාංජලී දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 395 හා 2004.06.01 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් බලය ලබා දී තිබූ අතර, මා 2006.11.20 වැනි දින ලංකාවට පැමිණි හෙයින් ඉහත කී අංක 395 දරන ඇටර්නි බලපත්‍රය 2006.11.20 වැනි දින සිට අවලංගු හා බල රහිත ලේඛනයක් බවත්, මෙතැන් පටන් මාගේ ඇටර්නි බලකරු විසින් මෙම ඇටර්නි බලපත්‍රය මත සිදු කරන සියලුම ක්‍රියා බලශූන්‍ය බවත්, සියලු දෙනාගේම දැන ගැනීම පිණිස මෙම දැන්වීම පළ කරමි.

12-721

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - මහරගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, බලයලත් මානක මර්වින් සමරනායක විසින් 1988 මාර්තු මස 08 වන දින සාදන ලද අංක 2198 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේපත්තු සල්පිටි කෝරළේ ඇරැව්වල පිහිටි මොරගහවත්ත ඉඩමේ ගහ කොළ වගාවන් සහ ගොඩනැගිලි සමග බෙදා වෙන් කරන ලද ලොට් 17 දරන පර්චස් විස්සයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්.20.3) විශාල ඉඩම වේ.

ඉජනා ජෙම්ස් ඇන්ඩ් ජුවලර්ස් යන නාමය අභිධානය සහ ආයතන යටතේ හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන රොහාන් වක්වැල්ල *හෙවත්* නම්බුකාර වක්වැල්ලගේ රොහාන් චන්ද්‍රසිරි සහ ඇන් ලක්මාලි ගජසිංහ ණයකරුවන් හැටියට ද සහ ඇන් ලක්මාලි ගජසිංහ උකස්කාරිය හැටියටද, කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 12 දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.05.19 දින රජයේ *ගැසට් පත්‍රයද*, ලංකාදීප, අයිලන්ඩ් හා තිනකරන් පත්‍රද, විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2006.12.22 දින රජයේ *ගැසට් පත්‍රයද*, ලංකාදීප, අයිලන්ඩ් සහ තිනකරන් පත්‍ර බලන්න.

*ඉඩමට පිවිසීම.*– පන්නිපිටිය මොරකැටිය හංදියේ සිට ඇරැව්වල පාර ඔස්සේ කිලෝමීටරයක් පමණ (කොස්හේන හංදිය පසුකර මීටර් 75 ක් පමණ) ගොස් ප්ලාන්ට් නර්සරි නමින් දැක්වෙන නාම පුවරුව ලගින් වමට හැරී ප්‍රාදේශීය සභා තාර පාර ඔස්සේ මීටර් 150 ක් පමණ ගියවිට අදාළ දේපළ පාරේ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
(2) පළාත් සභා බදු සඳහා සියයට එකයි (1%)
(3) වෙන්දේසිකරුගේ කොමිස් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%);
(4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සකස් කිරීම සඳහා රු. 2,000 ;
(5) ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 ;
(6) සියළුම ප්‍රචාරක වියදම් ද ;
(7) ගැණුම් මිලෙන් ඉතිරි (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලතදී කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ හෝ මහරගම ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා විමසන්න.

කළමණාකරු,
කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 154, හයිලෙවල්පාර,
මහරගම.
දුරකථන අංක : 2850505
2844915
2844914
ෆැක්ස් අංකය : 2851232.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ මහාධිකරණය
සහ දිසා අධිකරණය, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය සහ වාණිජ බැංකු.
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන /ෆැක්ස් අංකය : 2445393.

12-720

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 18/70717/වයි 18/799.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.11 දින *ගැසට්* පත්‍රයේ සහ 2006.01.23 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2007.01.27 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ මුරුතලගම ග්‍රාමයේ පිහිටි බෝගම එස්ටේට් නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එස් ගලගෙදර විසින් සකසන ලද 1996.12.20 දිනැති හා අංක 5361 ඒ දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 34 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද එකී පිඹුර මගින් පෙන්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක බී 688/230 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර, කොළඹ 03,
2006 දෙසැම්බර් මස 08 වැනි දින.

12-741/2

---

කොළඹ බස්නාහිර පළාත්බද වාණිජ අධිකරණයේ නඩු අංක : එච්. සී. (සිවිල්) 72/2000(1)

### ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි ලිමිටඩ්,

අංක 100/1, - 1/1, ශ්‍රී ජයවර්ධපුර මාවත, රාජගිරිය,

*එදිරිව* ඉන්වෙස්ට් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස්, කම්පැනි (ප්‍රයිවට් ලිමිටඩ්), වොන්ඩර්ලයිට් කන්සියුමර් ප්‍රොඩක්ට්ස් කම්පැනි (ප්‍රයිවට් ලිමිටඩ්) බාරේ, 10 වැනි සැතපුම් කණුව. අතුරුගිරිය පාර, මාලඹේ.

*පැමිණිලිකරු*...... *විත්තිකරු*......

විත්තිකාර පාර්ශවයෙන් පැමිණිලිකාර පාර්ශවයට අයවිය යුතු යැයි බස්නාහිර පළාත් බද වාණිජ මහාධිකරණයෙන් තීන්දු වී ඇති රු. 3,59,587.59 මුදලක් සහ ඒ මත 1999 ඔක්තෝබර් මස 1 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් වර්ෂයකට 36% ගණනේ වැඩි දුරටත් වන පොලිය සහ ව්‍යාපාරික පිරිවැටුම් බද්ද හා ආරක්ෂක බදු සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය ද අයකර ගැනීම සඳහා මා වෙත පවරා ඇති අධිකාරිය අනුව බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ සියඹලා ගොඩ ග්‍රාමයේ පිහිටි අක්. 02, රූ. 03, පර්. 22.50 ප්‍රමාණයෙන් යුත් කොස්ගහලන්ද නැමැති ඉඩම වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා පෙ.ව. 10.30 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනේ.

*ඉඩමට පිවිසීම*.– කොට්ටාව හන්දියෙන් පිළියන්දල පාරේ කි. මී. 04 ක් පමණ ගොස් දකුණු අතට හැරී පොල්ගස්ඕවිට පාරට පිවිසිය යුතුය. මෙම මාර්ගයේ කි. මී. 02 ක් පමණ ගමන් කල පසු හමුවන වම් අත පැත්තේ ඇල්ෆා කර්මාන්ත ශාලාව ද පසුකර ඉදිරියට යන විට වම් පසට හමුවන යුධ හමුදාවේ V වැනි බලකායේ ඉංජිනේරු රෙජිමේන්තුව ද පසු කර තවත් මීටර් 500 ක් පමණ ඉදිරියට ගමන් කර නැවතත් වම් අත පැත්තේ පිහිටි රිචඩ් පීරිස් ප්ලාස්ටිෂෙල් කර්මාන්ත ශාලාව පසුකර මීටර් 200 ක් පමණ ඉදිරියට ගොස් ජෑම් ගහ හන්දියෙන් වමට ඇති හගවිල වත්ත පාර දිගේ ගොස් රණතිසර උයන මාර්ග නාම පුවරුව ලගින් දකුණට ඇති පාරේ මීටර් 300 ක් පමණ ගොස් ඉන් පසු හමුවන රණවිරු ප්‍රේමසිරි මාවත දිගේ මීටර් 200 ක් පමණ (තාරපාර) ගොස් එතැන සිට එම පාරේම කොටසක් වන ගුරු පාරේ තවත් මීටර් 200ක් පමණ ගොස් දකුණට ඇති ඉඩමේ පිවිසුම් මාර්ගය ලෙස ඇති අඩි 20 ක් පළල පාරේ මීටර් 50 ක් පමණ ගිය පසු ඉඩමට පිවිසිය හැක.

*විකිණීමේ කොන්දේසි* :

1. මිටිය පහත හෙලන විටම ඉහළම ලංසුව තබන්නා තීන්දු මුදලින් 25% ක් ආපසු ගෙවන නොලබන අත්තිකාරම් මුදලක් ද, 2 1/2% වෙන්දේසිකරුගේ ගාස්තුව ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වෙන්දේසිකරුගේ ගාස්තුවෙන් 15% වැට් බද්දක් ද, අධිකරණයට ගෙවිය යුතු පළමුවන රු. 7,500 ට රු. 150 ද, ඊට අමතරව වැඩි වන මුදලට 1/2%, කණු ගාස්තුව ද, හෝමාගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු 1% විකුණුම් බද්දක් ද, ප්‍රචාරක ගාස්තුව ද, නීතිඥ ගාස්තුව ද ගෙවිය යුතුය.

2. ඉතිරි 75% වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත දී අධිකරණයට ගෙවිය යුතුවන අතර වෙන්දේසිකරු විසින් නියම කරනු ලැබුවහොත් එසේ ගෙවන බවට සහතික වීම සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු වෙන්දේසි දිනයේ දී ඉදිරිපත් කිරීමට ද ගැණුම්කරු බැඳී සිටියි.

*නිමිකම් විස්තර හා ඔප්පු පරීක්ෂාව*.–රාජගිරිය. ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 100/1-1/1 ලංකා ඔරික්ස් ලීසින් කම්පැනි ලිමිටඩ් වෙතින් කළ හැකිය.

එස්. නිමල් ද සිල්වා සා. වි.
උසාවි කොමසාරිස් තක්සේරුකරු,
බලයලත් වෙන්දේසිකරු.

අංක 439/1, ඇල්විටිගල මාවත,
කොළඹ 05.
දුරකථන අංකය : 2582213.

12-742

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : කේ/5/4997/කේවයි/3/690, කේ/5/5695/කේවයි3/839.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.06.09 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.11.13 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2007.01.27 වැනි දින පස්වරු 4.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහ නගර සභා සීමාවේ. පන්නගම, මල්වත්ත පාරේ, වරිපනම් අංක 72/14 සී හි පිහිටි පොනමඩේහේන *නොහොත්* පොනමඩේවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රන්වාගොඩ විසින් සකසන ලද 1999.12.04 දිනැති හා අංක 3936 ඒ දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 35.6 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද එකී මිණුම් පිඹුරේ කැබැලි අංක 7 (අඩි 10 පළල) මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඒ 102/ 221, 222 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර, කොළඹ 03.
2006 දෙසැම්බර් මස 08 වැනි දින,

12-741/7

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 18/71974/වයි18/929.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.11 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.01.23 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේදී 2007.01.27 වැනි දින පෙරවරු 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ උහුමීය මොරගොල්ල සහ පාම්බේ ග්‍රාමයන්හි පිහිටි ක්ලෝවිස් එස්ටේට් නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සකසන ලද 1997.10.30 දිනැති හා අංක 92/97 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 7 ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ.1, රූ. 0, පර්. 0 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක එෆ් 1166/128 හි ලියාපදිංචි කර ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර, කොළඹ 03.
2006 දෙසැම්බර් 08 වැනි දින,

12-741/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව - ප්‍රයිවෙට් බෑන්කිං යුනිට්

### 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ කොට්ඨාශයේ කුඹල්වෙල කෝරළේ, ඉඩමගම සහ පට්ටියකුඹුර පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඔරින්ටන් විසින් සාදන ලද 1950 පෙබරවාරි සහ නොවැම්බර් මාස වල අංක 1344 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රත්නගිරි එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 09 ලකුණු කළ ඉඩම් කොටස අක්කර දොළහයි රූඩ් දෙකයි පර්චස් දහතුනක් (අ. 12, රූ. 2, පර්. 13) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු යූ. නිමල් ජී. විජේවීර විසින් සාදන ලද 2000.07.12 දිනැති අංක 8024 දරන සැලැස්ම අනුව නැවත මැන අතුරු බෙදීමක් කර ඇති අතර ඒ අනුව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකඳ කොට්ඨාශයේ කුඹල්වෙල කෝරළේ, ඉඩමගම සහ පට්ටිය කුඹුර පිහිටි රත්නගිරි එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 1 ලකුණු කල ඉඩම් කොටස අක්කර තුනක් (අ. 3, රූ. 0. පර්. 0) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම සහ කැබලි අංක 3 ලකුණු කල ඉඩම් කොටස අක්කර නවයයි රූඩ් එකයි පර්චස් නවයක් (අ. 9, රූ. 1, පර්. 9) විශාල වෙනත් සියලු දේ සමඟ ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ලියාපදිංචි කර ඇත.

මෙම දේපළ බණ්ඩාරවෙල පදිංචි සෙල්ලයියා ප්‍රභාෂ් යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නාලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2007 ජනවාරි මස 11 වැනි දින පෙරවරු 10.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*– බණ්ඩාරවෙල නගරයේ සිට බදුල්ල පාරේ කි. මී. 10.5ක් ගොස් දකුණට ඇති ඇල්ල නගරයට යන පාරේ කි. මී. 27 කණුව පසුකර මීටර් 800ක් ගොස් දකුණට ඇති රත්නගිරි එස්ටේට් පාරට හැරෙන්න. මීටර් 500ක් ගිය විට හමුවන දකුණට ඇති බොරළු පාර දෙපස ඉඩම පිහිටා ඇත. මෙම ඉඩම රත්නගිරි එස්ටේට් හි කොටසකි.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2006.12.01 දින ද ලංකාදීප, ඩේලිමිරර් සහ වීරකේසරී යන පුවත්පත් වල 2006.11.13 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරී බද්ධ (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශනේ 2.5% (සියයට දෙකහාමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500. 6. සියළුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.–නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90. ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 0112456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011 2696155, 011-2572940.

12-719

---

## ඩීඑෆ්සීසී බැංකුව
## (කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීම

**10603 අංක දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ විස්තරය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකින්ද කොට්ඨාශයේ, හාලිඇල නගරයේ, බෝගොඩ කෝරළේ, ගන්නිලේකුඹුර (දැන් උස්බිමක්) යනුවෙන් හඳුන්වනු ලබන මිනින්දෝරු එම්. ෂයිසී ෆෝඩ් ස්මයිල් මහතා විසින් සහතික කරන ලද ප්ලෑන් අංක 469 දරන 2003 ජූලි 29 දින ඇපකරය යටතේ ගෙවීම් සිදුවී නොමැත. ඩී. එෆ්. සී. සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව ලොට් අංක 03 යනුවෙන් නිරූපිත ඉඩම් කොටස ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.30 එහි පිහිටි ගොඩනැගිලි හා අනෙකුත් සියලුම දේද වරිපනම් අංක 20/11, බදුල්ල පාරෙහි පිහිටි ඉඩම සමග.

හාලිහැල පදිංචි මුණසිංහ හෙට්ටිආරච්චිගේ සිරිමල් ශාන්ත රත්නපාල සහ ගෝතමී ආරියනාත ප්‍රේමදාස විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද ණය අංක 10603 දරන 2004 නොවැම්බර් මස 03 දින බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද මහතා විසින් සහතික කළ 2007 ජනවාරි මස 10 වැනි බදදා පෙ. ව. 11ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*– මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් 10%ක් ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි);
4. රු. 20,000 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක් ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500යි ;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000යි.

ගැණුම් මිලෙන් ඉතිරි 90%, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද, සමඟ අදාළ පරිදි වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න. දුරකථන අංකය 011-2440366.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී,
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර,
දුරකථන අංකය : 081-2227593
දුරකථන ෆැක්ස් අංකය : 081 222 4371

*නගර කාර්යාලය* :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක: 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් : 011 2588176.
ඊ-මේල් : samera@sri.lanka.net

12-718

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

B4 - B 079378